# 20 ළමා නාට්‍ය කලාව

මෙම පාඩම කොටස් දෙකකින් යුක්ත ය. පළමුව කොටසෙහි ළමා නාට්‍ය රචනයෙහි සහ නිෂ්පාදනයෙහි පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ සෝමලතා සුබසිංහ මහත්මියගේ **'පුංචි අපට දැන් තේරෙයි'** නාට්‍යයේ කොටසක් ඇතුළත් වෙයි.

ප්‍රවීණ වේදිකා රංග ශිල්පිනියක වන සෝමලතා සුබසිංහ මහත්මිය විසින් ළමයින් සඳහා ලියූ නාට්‍ය ගණනාවක් ඇත. **කතන්දර දෙකක් (1979), රත්මලී (2000), විකෘති (1992), පුංචි අපට දැන් තේරෙයි (1998), තොප්පි වෙළෙන්දා (2000), වලස් පවුල, හිම කුමරිය (2000)** ඉන් කිහිපයකි. මේ පාඩමෙහි පළමුව දැක්වෙන නාට්‍යය මගින් ළමා නාට්‍යයක විශේෂ ලක්ෂණ කිහිපයක් හඳුනා ගැනීමට හැකි වනු ඇත. චිත්ත රූප මැවෙනසුලු, රිද්මානුකූල පද ලාලිත්‍යයෙන් යුතු සුගම භාෂා ශෛලියක් මේ නාට්‍යය රචනයේ දී උපයෝගි කර ගෙන ඇත.

නාට්‍යයක් ලිවීමේ දී සැලකිය යුතු වැදගත් කරුණු පිළිබඳ තොරතුරු දෙවනුව ඉදිරිපත් කෙරෙන **ළමා නාට්‍ය නිර්මාණය** මගින් හෙළි වේ.

## පුංචි අපට දැන් තේරෙයි

**ගායක පිරිස :පුංචි කතාවක් කියන්න - පුංචි අපට සවන් දෙන්න**
**පුංචි පුංචි වැරදි ඇතත් - පුංචි අපට සමාවන්න**
(ගායක පිරිස පසුපසට ගමන් කරමින්)



**පුංචි අපේ කතන්දරේ - කුකුළුහාමි කෙනෙක් වෙසෙයි**
**මීහාමිලා හතර දෙනයි - වත්තේ මල් ගස් මෙ අපයි**
(මීහාමිලා හතර දෙනා දිව එති. ගායක පිරිස මල් පාත්තිය මෙන් සිට ගනිති.)
(කුකුළුහාමි වේදිකාව පිටුපසින් ඉදිරියට එයි. තම රාජකාරි කටයුතු, ගෙදර දොරේ කටයුතු කෙරෙහි යුහුසුලුවන බව අභිරූපණය කරති.)

ඈත එපිට ගම්මානෙක - උදෙන් නැගිට
බස බස ගා තටු විහිද - කුක්කු කු කුක් කියලා
ඉර පායන ආරංචිය - නොවරදවා ගමට කියන
නියම වෙලාවට හඬලන - කුකුළෙක් හිටියා
ඉර පායන ආරංචිය - මුදුනට එන ආරංචිය
ඉර බැස යන ආරංචිය - මුළු ගමට ම කියා සිටින
රාජකාරී භාරකාර - කුකුළුහාමි හරි දස්සයි
(මීහාමිලා හතර දෙනා එහෙ මෙහෙ දුවති.)

මී හාමිලා හතර දෙනයි - ඉන්ඩ තැනක් උන්ට නැතෙයි
කන්ඩ දෙයක් උන්ට නැතෙයි - බොන්ඩ දෙයක් උන්ට නැතෙයි

1 වන මීයා : කිසිම දෙයක් ලැබුණේ නෑ - කුස්සි ගානෙ ඇවිද්ද මම
දූන් ඉස්සර වාගෙ ගෙවල - වැඩිපුර කෑමක් නෑනේ

2 වන මීයා : මටත් නෑනේ - මොකුත් ලැබුණෙ
ගහක කොළක - පලතුරු නෑ
දලු කොළ නෑ - මිනිස්සු සූරාගෙන කාලා

3 වන මීයා : මිදුලක විසිකරපු දෙයක් - කසළ ගොඩක දාපු දෙයක්
අපි වාගේ අයට කන්න - නෑ දූන් ඉතුරුවක් වෙන්නෙ

සියල්ලෝ ම : හෝ හෝ ගාලා වැස්සක් - අඬු පුප්පා එන ඉස්සෙක්
දූන් දූන් මේ ළඟ එනවා - ගෙයක් සොයන්නට වෙනවා

4 වන මීයා : ගෙයක් හදා ගත්තත් දූන්
ඇඳ ඇතිරිලි - කොට්ට මෙට්ට
හදා ගන්න ලේසි නෑනෙ

2 වන මීයා : ඉතිං මොකද දූං කරන්නෙ

1 වන මීයා : අහල නැද්ද එහා ගමේ - කුකුළුහාමිගේ විස්තර
අසරණ අපි වගේ අයට - උදව් දෙන්න හරි කැමතිලු

සියල්ලෝ ම : එහෙනං අපි එහාට යමු - ගිහිං කුකුළුහාමි සොයමු
යමක් කමක් කරලා දීලා - ඉන්ට කන්ට සොයා ගනිමු
(පිරිස ගායනා කරති. මීයෝ අභිරූපණය කරති)
නියර දිගේ - දුවගෙන ගොස්
ඒ දණ්ඩෙන් - එගොඩ වෙලා
කඳු නැගලා කඩුලු පැනලා - මීහාමිලා හතර දෙනා
කුකුළුහාමි - සොයා යතෙයි

අන්න අතන තියන - ගෙදර වෙන්ටැ කුකුළුහාමි ඉන්නෙ
(සියල්ලෝ ම කුකුළුහාමිගේ ගේ දෙස එබී බලා)

දෙර නම් වසා ඇත - ගෙයින් පිට ගොස් වත් ද?
(කුකුළුහාමි එළියට එයි.)

මලක් : එච්චර කරදර මොකට ද? - කුකුළුහාමි අර ඉන්නේ
ගොහින් කතා කර බලන්න
(කුකුළුහාමි වට පිට බලයි.)

සියල්ලෝ ම : ආයුබෝවන්! කුකුළුහාමි

කුකුළුහාමි : ආයුබෝවන්! පොඩි දරුවෙනි - ඉතිං මොකද මේ පැත්තේ
ඇයි ද කතාවක් නැත්තේ?



මී පැටවු : කුකුළුහාමි මේ අහන්න - නැතෙයි අපට කන්න බොන්න
නැතෙයි අපට නිදා ගන්න - අනුකම්පාවක් කරන්න
අපට කන්න - ඉන්න දෙන්න
කුකුළුහාමි කියන වැඩක් - අපට ඇහැට පෙනෙන වැඩක්
කර දී අප උදව් වෙන්න - අනුකම්පාවක් කරන්න
අපට කන්න - ඉන්න දෙන්න

කුකුළුහාමි : හුරු බුහුටියි මේ පැටවුන් - අහිංසකයෝ වගේ පෙනෙයි
මගෙ පාළුවටත් එක්කල - ඉඳුම් හිටුම් දීම හොඳයි
සැමදා ඉස්කෝලේ යන්ට - පොතපත පාඩම් කරන්න
ලියනු කියනු ඉගෙන ගන්ට - හොඳ කීකරුව ම හිඳින්ට
කැමති ළමයි ඉන්නව නම් - කැමතියි මම ඉන්ට දෙන්න
කැමතියි මම කන්ට දෙන්න

ගායක පිරිස : අසරණ පැටවුන්ට ඉතින් - නැති හන්දා යන්ට තැනක්
නැති හන්ද කන්ට දෙයක් - කුකුළුහාමි දුක හිතිලා
ඉඳුම් හිටුම් දුන්නා
(පිරිස ගායනා කරන විට නළුවෝ නටති. අභිරූපණය කරති.)
කෑම පිහලා කුකුළුහාමි - ගේ අතුගා කුකුළුහාමි
ඉදල අරන් කුකුළුහාමි - මිදුලට බැස්සේ දවසක්
කුකුළුහාමි - කොක්... කොක්... කොක්...
පිදුරු මඩුව - අතුගාන්නේ

කුකුළුහාමි : මොකක් බොලේ - චක්... චක්... චක්...
බිම වැටිලා තියෙන්නේ - වී කරලක් !
හොඳට පැහුණු - රන්වන් වූ
වී කරලක් ! - වී ටික කොටලා ගත්තොත්
පිටි කොටලා කැවුම් සඳ
පුංචි උන්ට - කන්න ඇහැකි
(මීයන්ට අඬගසා)
මෙහෙට එන්න දරුවනේ - මේ වී කරලත් ගෙනේ
මෝලට ගොස් කඩිනමේ - කොටා ගෙනෙන්නේ

1 වන මීයා : ගෙදර වැඩක් අල්ලලා නෑ - ගණන් හදා ගෙන
නොගියොත් - දෙවි පිහිටයි මට !

2 වන මීයා : ලංකාවේ සිතියමකුයි - ගංගාවල් වරායවල්
ඇඳගෙන යන්නට - ඇත මට

3 වන මීයා : මගේ ඔළුව කැක්කුම වගේ - බඩත් ටිකක් රිදෙනවා !

4 වන මීයා : කෝ මාගේ වයලීනය - පුරුදු වෙලා නොගියෝතින් !

කුකුළුහාමි : හා! හා! මට තේරෙනවා - කාටත් හරියට වැඩ බව
හොඳයි කාටවත් බැරි නම් - මම ම කොටා ගෙන එන්නං

පිරිස : කම්මැළි නෑ - කුකුළුහාමි
වී කරලත් මල්ලක ද - වී කොටලා එන්ට යතෙයි
මී පැටවුන් දඟ කාරයි - හිත සැමවිට සෙල්ලමටයි
කුකුළුහාමි ගෙදරින් පිට - ගියොත් සෙල්ලමේ ම තමයි

කුකුළුහාමි : මෙන්න හාල් මං ගෙනාව - කැවුම් කන්න
ආස කෙනෙක් - එන්න ඇවිත්
පිටි කොටන්න //

1 වන මීයා : මං කවි පාඩම් කරනවා !
2 වන මීයා : සිතියම් ඇඳ ඉවර නැතේ !
3 වන මීයා : මගෙ ඔළුව කැක්කුම වගේ !
4 වන මීයා : ස.... රි.... ග.... ම... !

කුකුළුහාමි : ඔව් ! ඔව් !! මට තේරෙනවා - කාටත් හරියට වැඩ බව
ඉතින් කාටවත් බැරිනං - ඒකත් මං කොටන්නංකො

පිරිස : ඩෝං ඩෝං පිටි කොටන්නෙ //
සුරුං සුරුං පිටි හළන්නෙ //
පිටි කොටලා පිටි හළලා - කුකුළුහාමි හඬලනවා //
පිටි කොටලා පිටි හළලා - සුදට සුදේ බලන්නේ
කැවුම් කන්න ආස කෙනෙක් - කැවුම් උයා කෑවා නම්.....

1 වන මීයා : අපේ අප්පෝ තෙල් තාච්චිය - පෙරළුනොතිං මම ඉවරයි !
2 වන මීයා : ගින්දර අල්ලන්න එපා - අපේ අම්මා මට කිව්වා !
3 වන මීයා : කැවුම් කන්න පණු ගායට - පුංචි උන්ට හොඳ නැහැල්ලු !
4 වන මීයා : මම නැහැ පැණි රහට කැමති !

කුකුළුහාමි : හොඳයි කාටවත් බැරිනම් - කැවුම් ටිකත් උයන්නංකො

පිරිස : පිටිත් කොටාගෙන - පැණිත් සොයාගෙන
තෙලුත් සොයාගෙන - දරත් සොයාගෙන
ළිප හදලා තාච්චියේ - කැවුම් ඉදෙන්නේ
චෝස්... චෝස්... චිරි... චිරි... චිරි
කැවුම් ඉදෙන්නේ - තරිකිට කැවුම් ඉදෙන්නේ

1 වන මීයා : හරි සුවඳයි !
3 වන මීයා : පිඟන් ගෙනෙමු - පිඟන් ගෙනෙමු
කැවුම් කන්ට අපි - යමු යමු හනිකේ

සියල්ලෝ ම : තක්කිට තරිකිට තරිකිට - කැවුම් ඉදී ඇතෙයි
පිඟාන පිරිලා කැවුමෙන් - මේසය උඩ වෙයි
අම්මගෙ කොණ්ඩය වගේ ම - ඒ කොණ්ඩය වෙයි
අපටත් කැවුමක් කන්නට - සිකුරට ලැබෙතෙයි

පිරිස : ඉවසුම් නෑ මී පැටවුන්ට - සුවඳ කැවුම් රස කර කන්නට
කුකුළුහාමි එය දූන හොඳට - සිටී එවග නොදනුණ ලෙසට

| | |
|---|---|
| 1 වන මීයා : | කුකුළුහාමි කරුණාවයි - අප ගැන අනුකම්පාවයි<br>කැවුම් උයා මහන්සියි ද? - කැවුම් හොඳට පදම් වී ද? |
| කුකුළුහාමි : | අපොයි ඒක සුළු වැඩක්නෙ! - කැවුම් පිහුම් සෙල්ලමක්නෙ! |
| කුකුළුහාමි : | කවුදැයි කවුදැයි කරල ගෙනාවේ? |
| මී පැටවු : | කුකුළුහාමි නොවැ කරල ගෙනාවේ |
| කුකුළුහාමි : | කවුදැයි වී ටික කොටලා ගෙනාවේ? |
| මී පැටවු : | (ඉතා උද්යෝගිමත් ව)<br>කුකුළුහාමි නොවැ - කොටලා ගෙනාවේ<br>මෝලට ගොස් වී - කොටලා ගෙනාවේ |
| කුකුළුහාමි : | කවුදැයි ඉන් පිටි කොටලා ගත්තේ ! |
| මී පැටවු : | කුකුළුහාමි නොවැ කොටලා ගත්තේ<br>කොටාපු පිටි ටික හළලා ගත්තේ ? |
| කුකුළුහාමි : | කවුද කැවුම් ටික උයලා ගත්තේ ? |
| පැටවු 4 : | කුකුළුහාමිමයි උයලා ගත්තේ //<br>(පසු බසිමින්) |
| කුකුළුහාමි : | කවුද කැවුම් ටික කන්නට ඕනෑ ? |
| පැටවු 4 : | කුකුළුහාමිමයි කන්නට ඕනෑ<br>(පරාජිත ව) |
| සියල්ලෝ ම : | වී කොටන්න බෑ - පිටි කොටන්න බෑ<br>(මීයෝ ආපසු හැරී යති)<br>කිසි ම වැඩක් බෑ - ඉතින් කැවුම් කන්ට බෑ |
| කුකුළුහාමි : | හා! හා! හා! දරුවනේ - යන්ට එපා දරුවනේ<br>අදට කැවුම් කන්නට හැකි - නමුත් මේක අහගන්නේ<br>මේ ලෝකේ කවුරු නමුත්<br>වැඩපළ නොකරනවා නම්<br>නිකම් ඔහේ පුටු පිට ඉඳ - කන්ට හොඳත් නෑ |
| පැටවු 4 : | පුංචි අපට දැන් තේරෙයි - පුංචි අපට දැන් තේරෙයි |

# ළමා නාට්‍ය නිර්මාණය

වර්තමානයෙහි ළමා නාට්‍ය එයට ම සුවිශේෂ වූ අංග ලක්ෂණවලින් හෙබි රංග කලා අංශයක් ලෙස වර්ධනය වී ඇත. ළමා ප්‍රේක්ෂකයන්ට නාට්‍යමය අත්දැකීම් ලබා දෙන ළමා නාට්‍ය පුළුල් වශයෙන් වර්ග තුනකට බෙදා දැක්විය හැකි ය.

1. **ළමයින් විසින් ළමයින් සඳහා ඉදිරිපත් කරනු ලබන නාට්‍ය**
2. **වැඩිහිටියන් විසින් ළමයින් උදෙසා රචනා කරනු ලැබ නිෂ්පාදනය කෙරෙන ළමා නාට්‍ය**
3. **අධ්‍යාපනික නාට්‍ය**

මින් කුමන ගණයකට අයත් වුව ද ළමා නාට්‍ය, අනෙකුත් නාට්‍ය මෙන් ම සාමූහික සන්නිවේදන මාධ්‍යයකි.

**'පුංචි අපට දූන් තේරෙයි'** නාට්‍යයෙහි පහත දැක්වෙන දර්ශනය දෙස විමසුම් ඇසින් බලන්න.



චරිත ලෙස රඟ පාන කිහිප දෙනෙක් සිටිති. ප්‍රධාන චරිතය වන්නේ කුකුළු හාමියි. මී හාමිලා සතර දෙනෙකි. ගායක පිරිස පස් දෙනෙකි. පසුබිම් දර්ශනයෙහි ගස්, මල්, ගෙට යන ඉණිමගක්, පැලක් වෙයි.

නාට්‍ය රචකයා නාට්‍යයක් වේදිකාගත කිරීමේ නියැලෙන්නවුන් අතුරෙන් එක් අයෙක් පමණි. මීට අමතර ව එක් එක් දර්ශනය සඳහා වේදිකාව සැකසීම, වර්ණ විදුලි බුබුළුවලින් වේදිකාව ආලෝක කිරීම, තිරය විවෘත කිරීම සහ වැසීම ආදි බාහිර කාර්යයන් සමූහයක් ඉටු කිරීම සඳහා ද පිරිසක් දායක වෙති. බොහෝ විට නාට්‍යය නිෂ්පාදනය කරන්නේ රචකයා ම නොවේ. රචකයාගේ අදහස් වේදිකාව මත ගෙන හැර දක්වන්නේ නිෂ්පාදකයා ය. නාට්‍යයේ මුදුන් මුල රචකයා ය. ගස අතු ඉති ලා වැඩෙන්නේ මුල ශක්තිමත් වූ පමණට ය.

අපි එදිනෙදා ජීවිතයේ දී කෙටිකතා, නවකතා, කවි කියවා ඇත්තෙමු. ඒවා කියවා රස විඳින කාව්‍ය ගණයට අයත් වෙයි. නාට්‍ය, ටෙලිනාට්‍ය, චිත්‍රපට ආදිය නරඹා රස විඳිය යුතු ඒවා ය. ඒවා දෘශ්‍ය කාව්‍ය ලෙස සැලකේ. ඒවායින් උපරිම වින්දනයක් ලැබෙන්නේ වේදිකාවක රඟ දැක්වෙනු නරඹන විට ය.

නාට්‍යයෙන් පැවසෙන්නේ ද කතාවකි. නවකතාව හෝ කෙටිකතාව හෝ කියවා රස විඳින්නකි. නාට්‍යය බලා රස විඳින්නකි. ලිඛිත කතන්දරය ප්‍රකාශ වන්නේ අතීත කාලයෙනි. නාට්‍යය ඉදිරිපත් කෙරෙන්නේ වර්තමාන ස්වරූපයෙනි. නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂකයා නාට්‍යයේ සිදුවීම් මාලාව තමා ඉදිරියේ එවෙලේ ම සිදු වන්නක් ලෙස දකියි. කතන්දරයක් කියවන පාඨකයා හෝ අසන ශ්‍රාවකයා හෝ එහි සිද්ධි හා අවස්ථා තම සිතෙහි චිත්ත රූප මවමින් පරිකල්පනය කළ යුතු ය. කතන්දරය හා නිරූපණය වන චරිත, අවස්ථා ලේඛකයා උචිත වචන උපයෝගි කර ගනිමින් පාඨකයා ඉදිරියේ මවා පායි.

කුමාරතුංග මුනිදාසයන්ගේ **(හීන් සැරය)** පොතෙහි සඳහන් වන මෙම විස්තරය කියවා බලන්න.

**"හිවල්හාමි මෙසේ කීවා විතරයි, අලිරාලහාමි මර හඬ නගා ගෙන නැගී සිටියේ ය. කරකැවුණේ ය. ඇස් තදින් පියාගත්තේ ය. හිවල්හාමි වෙදකම මතක නැති කොට බොහෝ තැන් දිව ගොස් යන්තම් හොඳ සිහි එළවා ගෙන හැරී බැලුවේ ය. අලිරාලහාමි තමා පස්සේ නො එන බව දැන ගසකට මුවා වී බලා සිටියේ ය."**

රෝගී වූ අලියා හැසිරුණු ආකාරය සහ හිවල්හාමි බිය වී දිවූ ආකාරය පාඨකයා සිතින් මවා ගැනීමට තැත්කරයි. නාට්‍යයක නම් අලියාගේ සහ නරියාගේ චර්යා වේදිකාවේ රඟ දැක්විය යුතු ය. නාට්‍යයක් රචනා කරන තැනැත්තා පළමු ව නාට්‍යෝචිත අවස්ථා සහ ගැටුමක් ඇති කතාවක් තෝරා ගත යුතු ය. මේ නිසා සෑම කතාවක් ම නාට්‍යයක් සඳහා සුදුසු නොවේ. නාට්‍යෝචිත අවස්ථා බහුල ව ඇති ජන කතා, ජාතක කතා ආදි කතා බොහෝ ය. එමෙන් ම ළමයින්ට ගෝචර වූ ළමයින්ගේ සිත් ප්‍රබෝධවත් කරන සිදුවීම් සහිත කතා නොයෙක් විට අසන්නට දකින්නට ලැබේ.

මේ අනුව, **පුංචි අපට දූන් තේරෙයි** නාට්‍යයේ වස්තු බීජයේ ඇති ගැටලුව සහ එය නිරාකරණය වන ආකාරය විමසා බලන්න.

1998 රාජ්‍ය නාට්‍ය උලෙළ ප්‍රථම ස්ථානය දිනූ අමිතා රබ්බිඩිගලගේ **'සෙල්ලං ලෙල්ලං'** නම් ළමා නාට්‍යයට වස්තු බීජය වන්නේ දවස පුරා සෙල්ලම් කිරීමට ඇබ්බැහි වූ රාජු නම් ළමයෙකුට වූ ඇබැද්දියකි. සීමාව ඉක්මවා සෙල්ලමට ළැදි වුවොත් සෙල්ලම ලෙල්ලමක් වන බවත් මෙම නාට්‍යය කියා පායි.

**සෙල්ලං ලෙල්ලං** නාට්‍යය ආරම්භ වන්නේ මෙසේ ය.

(තිරය සෙමින් ඇරෙයි)

(දුම්රිය නළා හඬ පසුබිමින් ඇසෙයි. අනතුරු ව දුම්රියක් ගමන් කරන හඬ ඇසෙයි. රාජු පෙරටු කර ගත් ළමයි සෙල්ලම් කෝච්චියක් ලෙස ගමන් කරති.)

ළමයි : (කටින් ගයති)

**කුෂු... කුෂු... කුෂු... කුෂු...//**
**උඩරට මැණිකෙට පට කුඩ දෙක දෙක**
**කොයිබින් එන්නේ කවුරුද දන්නේ**
**කොහෙදෝ යන්නේ කොළඹයි යන්නේ**

**කුෂු... කුෂු.... කුෂු... කුෂු...//**
**පෙට්ටි ගොඩයි පෙට්ටි ගොඩයි**
**වංගු ගොඩයි වංගු ගොඩයි**
**අඟුරු කකා වතුර බිබී**
**කොළඹ දුවන යකඩ යකා**

**ඕන්න එනවෝ ඕන්න එනවෝ**



(හඬ නතර වෙයි. දුම්රිය ඉදිරියට යන බව හැඟෙන සේ ළමයින්ගේ ඉරියව් වෙනස් වෙයි.)

නාට්‍ය රචකයාගේ කාර්යය වන්නේ නාට්‍ය පෙළ හෙවත් පිටපත සකස් කිරීම ය. නාට්‍යයේ පදනම එයයි. වචන උච්චාරණය කිරීමේ දී හඬ උස් පහත් කරන ආකාරය විරාමය (නැවතීම) ආදිය හැමෙකක් ම නැතත් සමහර අංග පෙළෙහි දැක්විය හැකි ය. ආත්ම භාෂණයේ යෙදෙමින් **'තමාට ම'** යනුවෙන් දක්වන්නේ එබඳු තැන් ය.

මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ **කදා වළලු** නාට්‍යයෙහි

සේරිවාණිජ : **ආඃ එහෙම ද? (තමාට ම) හරි ම කාලකණ්ණි ගේකට නෙ මම උදේ පාන්දරින් ම ආවේ! (හඬ නගා) වළලු ගන්න හැදුවේ සල්ලි නැතිව ද? මගේ කාලෙත් අපතේ ගියා.**

නාට්‍යයක චරිත අපට හඳුනා ගැනීමට ලැබෙන්නේ ඔවුන් කරන කියන දෙයිනි. දෙබස් මාර්ගයෙනි. එම දෙබස් ගද්‍යයෙන් හෝ පද්‍යයෙන් විය හැකි ය. නාට්‍යයක රචකයා යොදන වචන වූ කලි නාට්‍යයෙහි මුඛ්‍ය කේන්ද්‍රීය අදහස් පදනම් කරගෙන චරිත සජීවී බවට පත් කරවන වාං මාලාවකි.

නාට්‍යයේ දෙබස් සඳහා වචන යෙදීමේ දී රචකයා බෙහෙවින් කල්පනාකාරී විය යුතු ය. භාවපූර්ණ චිත්ත රූප මැවෙන වචන ප්‍රේක්ෂකයා ආකර්ෂණය කිරීමෙහි සමත් වෙයි. දයානන්ද ගුණවර්ධනගේ **නරි බෑණා** නාට්‍යයෙහි ඇතුළත් වන, වනයෙහි දර කැඩීමට ගිය ගම දුව ගායනා කරන ගීතය බලන්න.



**ඇහැළ මලින් ගස් පිරිලා**
**බලන්න හරි ලස්සනයි**
**අඹ රඹුටන් ජම්බු ඉදිලා**
**අද හැම තැන හරි හැඩයි**

**දෙඹ ගස් යට මල් හැලිලා**
**සුවඳක් හැම තැන දැනෙයි**
**වලිකුකුළන් හඬලන කොට**
**අහං ඉන්න හරි හිතයි**

**ගස්වල දලු නැළවෙන කොට**
**ඇඟට හරිම සීතලයි**
**ඉගිලෙන අර සමනලයින්**
**අල්ලන්නට බැරි හැඩයි**

මේ ගීය අප සිතෙහි චමත්කාර ජනක සිතුවමක් ඇඳීමට සමත් වන්නේ එහි භාවිත කර ඇති වචන සමුදය හේතුවෙනි. පරිසරයේ සුන්දරත්වය මෙහි නිරූපණය කර ඇති ආකාරය විමසා බලන්න. මෙහිදී නාට්‍ය රචකයා උපයෝගි කර ගෙන ඇති වචනවල ප්‍රබලත්වය රස ජනනයට හේතු වී ඇත.

**පුංචි අපට දූන් තේරෙයි** නාට්‍යයේ මේ අනුකරණාත්මක වදන් ප්‍රේක්ෂක මනසෙහි තුළ සුන්දර හැඟීම් ජනිත කරයි.

**"ඩෝං ඩෝං පිටි කොටන්නෙ**
**සුරුං සුරුං පිටි හළන්නෙ**
**කුකුළුහාමි හඬලනවා**

**චෝස්... චෝස්... චිරි... චිරි... චිරි**
**කැවුම් ඉදෙන්නේ"**

ඒ ඒ අවස්ථාවල දී චරිත වේදිකාවට පිවිසීම, පිට වීම, රඟපාන අවස්ථාවල දී වේදිකාවේ සිටින්නේ කුමන චරිතය ද ආදිය ගැන රචකයා පරිකල්පනය කළ යුතු වෙයි.

නාට්‍යය රඟ දැක්වීමට යන කාලය ගැන ද රචකයා සිය අවධානය යොමු කළ යුතු ය. ළමයින් සඳහා වන නාට්‍යයක් විනාඩි 15 45ත් අතර කාලයක දී නිම වන්නේ නම් මැනවි.

ළමා නාට්‍යයකින් සමාජයට සදචාරාත්මක පණිවිඩයක් ලැබිය යුතු ය. ළමා නාට්‍යයක් සතුටින් කෙළවර වන සුබාන්තයක් විය යුතු යැයි ද විචාරකයෝ පවසති.

සෝමලතා සුබසිංහ මහත්මියගේ **පුංචි අපට දූන් තේරෙයි** නාට්‍යයේ ඉර පායන, ඉර මුදුනට එන, ඉර බැස යන ආරංචිය මුළු ගමට ම කියා පාන දක්ෂ කුකුළුහාමි, යන්න එන්න තැනක් නැති ව සිටි මී පැටවුන් ගෙදර නවතා ගෙන උදවු කරයි. එහෙත් ඔවුහු කුකුළුහාමිට ගෙදර දොරේ කටයුතුවල දී කිසි සේත් උදවු නොකරති. අහම්බෙන් ලැබුණු වී කරලින් පිටි කොටා කැවුම් සෑදීම කුකුළුහාමි කරන්නේ තනි ව ම ය. එහෙත් පසුව මී පැටවුන්ට අනුකම්පා කර කැවුම් දෙයි.

**"හා! හා! හා! දරුවනේ - යන්ට එපා දරුවනේ**
**අදට කැවුම් කාපල්ලා - නමුත් මේක අහගන්නේ**

**මේ ලෝකේ කවුරු නමුත් - වැඩපළ නොකරනවා නම්**
**නිකම් ඔහේ පුටුපිට ඉඳ - කන්ට හොඳත් නෑ**

**පුංචි පුංචි ඔළු එකතුව - පුංචි පුංචි අත් එකතුව**
**පුංචි අපට ලොකු දේවල් - කරන්ට බැරි නෑ**
**පුංචි අපට දූන් තේරෙයි ! - පුංචි අපට දූන් තේරෙයි !"**

මෙහි දක්වෙන්නේ වැඩිහිටි කුඩා සියලු දෙනාගේ ම ජීවිත සාර්ථක කර ගැනීමට උපකාර වන ගැඹුරු දර්ශනික කියමනකි.

නාට්‍ය නිර්මාණයේ දී නිෂ්පාදනය කිරීමේ දී මෙන් ම නැරඹීමේ දී අවධානය යොමු කළ යුතු අංග සතරක් ඇත. භරත මුනිවරයාගේ **නාට්‍ය ශාස්ත්‍රය** නම් ග්‍රන්ථයෙහි මෙම අභිනය වර්ග සතර විස්තර වෙයි.

1. **ආංගිකාභිනය** -
   නළු නිළියන් විසින් අත් පා සහ ශරීරාංගවලින් කරනු ලබන රඟපෑම
2. **වාචිකාභිනය** -
   නාට්‍යයේ පිටපත හෙවත් පෙළ, නාට්‍යයේ සංවාද, ආත්ම භාෂණ, හැඟීම් දනවන ආකාරයට වචන උච්චාරණය කිරීම
3. **සාත්විකාභිනය** -
   ඇස්, තොල්, නළල ආදිය උපයෝගි කරගෙන භය, ත්‍රාසය, ශෝකය, ආදරය ආදි හැඟීම් මුහුණින් ප්‍රකාශ කිරීම
4. **ආහාර්යාභිනය** -
   නළුනිළියන් පරිහරණය කරන රංග භාණ්ඩ, ඇඳුම් පැළඳුම්, වේදිකා සැරසිලි ආදිය



නාට්‍යයක සජීවී බව, ජීවමාන බව ඇති වන්නේ මේ සතර අභිනයන් ම සම්මිශ්‍රණය වූ විට ය. නාට්‍යයෙහි පෙළ ඉදිරිපත් කර ඇත්තේ ගද්‍යයෙන් ද? පද්‍යයෙන් ද? කථා වස්තුව ඉදිරිපත් කරන සූත්‍රධාර හෝ පූරක වැනි අයත් සිටිත් ද? ආදි කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. මෙසේ බලන කල ළමා නාට්‍ය පිටපතක් සකස් කරන්නා වස්තුබීජය, එය ඉදිරිපත් කරන ආකාරය, ගැටලුව විසඳෙන ආකාරය, ජවනිකා සකස් කිරීම, රංග විධාන, නාට්‍යයෙහි උපයෝගි කරගන්නා භාෂාව, අවසානය ආදි සියලු කරුණු කෙරෙහි සිය අවධානය යොමු කළ යුතු බව පෙනේ.

**අරුත් පැහැදිලි කිරීම්**

| | | |
|---|---|---|
| ආත්ම භාෂණ | | නළු නිළියන් තමාට ම කියා ගන්නා ප්‍රකාශ |
| ජවනිකා | | දර්ශන |
| නාට්‍ය රචකයා | | නාට්‍ය ලියන තැනැත්තා |
| නාට්‍ය නිෂ්පාදකයා | | නාට්‍ය වේදිකා ගත කිරීමට සූදනම් කරන්නා |
| නාට්‍යෝචිත අවස්ථා | | රඟ දක්වා පෙන්වීමට සුදුසු අවස්ථා |
| ප්‍රේක්ෂකයා | | නරඹන්නා |
| රංගභූමිය | | (නාට්‍යය) රඟ දක්වන වේදිකාව |
| රංග විධාන | - | රඟපෑමේ දී පිළිපැදිය යුතු උපදෙස් වරහන් තුළ ඇති රංග විධාන උස් හඬින් උච්චාරණය නොකළ යුතු ඒවා ය. සමහර විට නාට්‍යයේ පෙළ කිව යුතු ආකාරයපෙන්නුම් කරයි.<br>උදා: (දුකින්) |
| වේදිකා භාණ්ඩ | | වේදිකාවේ පාවිච්චි කෙරෙන භාණ්ඩ |
| සංවාද | | කතාබහ |
| ශ්‍රාවකයා | | අසන්නා |
| නේපථ්‍යාගාරය | - | නළු නිළියන් ඇඳුම්, ආභරණ, ආයිත්තම් පලඳින ස්ථානය |

## ක්‍රියාකාරකම් 01

**ඔබේ අභ්‍යාස පොතේ පිළිතුරු ලියන්න.**

(i) රංග විධාන තුනක් '**පුංචි අපට දුන් තේරෙයි**' නාට්‍ය පිටපතෙන් සොයා ලියන්න. අවස්ථා දක්වන්න.
(ii) අභිනය සතර හඳුන්වන්න.
(iii) නාට්‍යයක් රචනා කරන්නා විසින් සැලකිය යුතු කරුණු මොනවා දැයි පැහැදිලි කරන්න.
(iv) ඔබ නැරඹූ නාට්‍යයක තේමාව, චරිත, රඟපෑම, නිර්මාණ හා වේදිකා සැරසිලි ගැන විස්තරයක් ලියන්න.

## ක්‍රියාකාරකම් 02

(i) පන්තියේ ළමයින් අතර චරිත බෙදා ගෙන **පුංචි අපට දුන් තේරෙයි** නාට්‍ය කොටස හඬ නගා කියවන්න.

(ii) කුකුළුහාමිට වී කරල ලැබුණායින් පසු ව මී පැටවුන් සහ කුකුළුහාමි අතර ඇති වූ සංවාදය ඔබේ වචනයෙන් ලියන්න.

(iii) පිටි කෙටීමෙන් අනතුරු ව කැවුම් කන්න ආසා කරන කෙනෙකුට කැවුම් උයා ගන්නා ලෙස කී කල මී පැටවුන් නිදහසට කියන කරුණු මොනවා ද?

(iv) **'කුකුළුහාමිගේ හැසිරීමෙන් හෙළිවන්නේ දරුවන්ගේ අඩුලුහුඬුකම් ඉවසන මවුපිය ගුණය යි.'** උදාහරණ දෙමින් ඔබේ අදහස පැහැදිලි කරන්න.

(v) යෝග්‍ය ඇඳුම් පැළඳුම්වලින් සැරසී මෙම නාට්‍යය රඟ දක්වන්න.

## ක්‍රියාකාරකම් 03

**පහත දැක්වෙන අවස්ථාවල දී ඇති විය හැකි නාට්‍යමය සංවාද ලියන්න.**

(i) පුතා යහළුවන් සමග විනෝද චාරිකාවකට යාමට සූදානම් වෙමින් සිටියි. පුතා, මව සහ පියා අතර ඇති වන සංවාදය.
(ii) පන්තියේ සිටින යහළුවකු ලබන සතියේ තම දෙමාපියන් සමග විදේශයකට යාමට නියමිත ය. ඒ ගැන පන්තියේ ළමයින් අතර ඇති වන කතාබහ.

## ක්‍රියාකාරකම් 04

(i) පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට සංවිධානය වී ඔබ කැමති කතාවක් තෝරා ගෙන නාට්‍ය පිටපතක් ලියන්න. එය පන්තියේ දී රඟ දක්වන්න.